සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2019

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

07 ශ්‍රේණිය — කාලය පැය 02 යි.

| නම/ විභාග අංකය: |
|---|

## I කොටස

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු ය.
- අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 පරිගණක පද්ධතියේ ප්‍රධාන සංරචකයන් වන්නේ,
(1) ආදාන, සැකසීම්, ප්‍රතිධාන (2) සැකසීම්, ප්‍රතිදාන, අවායනය
(3) ආදාන, ප්‍රතිධාන, ආවයනය (4) ආවයනය, සන්නිවේදන, ප්‍රතිදාන

02 පහත සඳහන් දෑ අතරින් නිහිත පරිගණකයක් වන්නේ,
(1) රේඩියෝව (2) ගණක යන්ත්‍රය
(3) රෙදි සෝදන යන්ත්‍රය (4) යතුරු ලියනය

03 පරිගණක මවු පුවරුව (mother board) පිහිටා ඇත්තේ .................................................... තුළ ය.
(1) CPU (2) පද්ධති ඒකකය (3) සංදර්ශකය (4) මොඩමය

04 බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය (Multimedia Projector) යනු,
(1) ආදාන උපක්‍රමයකි. (2) ආවයන උපක්‍රමයකි.
(3) ප්‍රතිදාන උපක්‍රමයකි. (4) සැකසුම් උපක්‍රමයකි.

05 පරිගණකයේ කාර්යක්ෂමතාවය රඳාපවතින මතක ඒකකය වන්නේ,
(1) RAM (2) ROM
(3) Hard Disk මතකය (4) සැනලි මතකය

06 පරිගණක විද්‍යාගාරයකදී පරිගණකයට සැපයෙන විදුලි බලය පාලනයකින් යුතුව ලබාදෙන්නේ,
(1) UPS මගිනි. (2) CPU මගිනි.
(3) බිත්ති කෙවෙනි මගිනි. (4) පද්ධති ඒකකය මගිනි.

07 MS Word යනු,
(1) පද්ධති මෘදුකාංගයකි. (2) මෙහෙයුම් පද්ධතියකි.
(3) යෙදවුම් මෘදුකාංගයකි. (4) පරිශීලන වැඩසටහනකි.

08 ඇල්ගෝරිතමයක  සංකේතයෙන් නිරූපණය වන්නේ,
(1) දත්ත ඇතුලත් කිරීම පමණි. (2) සංදර්ශනය පමණි.
(3) සැකසීම පමණි. (4) ඇතුළත් කිරීම හා සංදර්ශනය පමණි.

09 අන්තර්ජාලය තුළ ඇති වෙබ් පිටු දකබලාගත හැක්කේ .................................................... මගිනි.
(1) සෙවුම් යන්ත්‍රයක් (2) වෙබ් අතරික්සුවක්
(3) පද්ධති මෘදුකාංගයක් (4) පරිගණක වැඩසටහනක්

10 මධ්‍යම සැකසුම් ඒකකයේ සියළු ගණිතමය හා තාර්කික කර්මයක් සිදුකරනු ලබන්නේ,
(1) CU මගිනි. (2) Memory මගිනි. (3) ALU මගිනි. (4) CPU මගිනි.

- අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ සත්‍ය හෝ වඩාත් නිවැරදි නම් (✓) ලකුණ ද, අසත්‍ය හෝ වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

11 පළමු පරිගණක පරම්පරාවේදී භාවිතා කළ ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය ලෙස රික්තක නල නම්කළ හැකි ය. (.......)

12 පරිගණකයේ මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය GB වලින් මනිනු ලැබේ. (.......)

13 Fedora යනු ලිනක්ස් භාවිතා කළ සැකසූ මෙහෙයුම් පද්ධතියක් සඳහා උදාහරණයක් වේ. (.......)

14 දුම්බක මාධ්‍ය දත්ත ගබඩා කළ අවස්ථාවක් ලෙස CD හැඳින්විය හැකි ය. (.......)

15 පරිගණකයේ තැම්පත් කරන File සුරක්ෂිත කිරීමට හා එක්තැන් කිරීමට ලිපිගොනු (Folders) භාවිතා කළ හැකි ය. (.......)

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා කෙටි පිළිතුරු සපයන්න.

16 ප්‍රධාන පාලන බොත්තම් අතරින් පහත බොත්තම් නම් කරන්න.




17 grade 07.doc මෙම ලිපියේ ගොනු නාමය හා දිගුව වෙන වෙනම නම් කරන්න.

-----------------------------------------------------------------------

18 මූසිකයේ ABC කොටස් නම් කරන්න.




19 පරිගණකයේ දිශානති යතුරු හඳුන්වන වෙනත් නමක් ලියන්න.

20 පරිගණකයේ යතුරු පුවරුවේ වෙනත් යතුරු වර්ග දෙකක් ලියන්න. (ල. 40)

## II කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගිනි.**

01 (1) පරිගණකය නිර්වචනය කරන්න.
   (2) පරිගණක පද්ධතියේ ප්‍රධාන සංරචකයන් නම් කරන්න.
   (3) දත්ත ආදාන, ප්‍රතිධාන, සැකසීම් හා ආචයනය සිදුකරන උපක්‍රමයන් 1 බැගින් ලියන්න.
   (4) පරිගණකයේ ලක්‍ෂණ තුනක් ලියන්න.

02 (1) පරිගණක විද්‍යාගාරයේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම හතරක් ලියන්න.
   (2) පරිගණකය වැරදි ඉරියව්වෙන් භාවිතා කිරීම නිසා මුහුණ පෑමට සිදුවන අහිතකර තත්ත්ව හතරක් ලියන්න.
   (3) අධ්‍යාපන හා කර්මාන්ත ක්ෂේත්‍ර තුළ පරිගණක භාවිතා වන ආකාරයන් දෙක බැගින් ලියන්න.

03 (1) ඇල්ගොරිතමයක් යනු කුමක් ද?
   (2) පහත සඳහන් ඇල්ගොරිතම සංකේතවල භාවිතයන් ලියන්න.




   (3) සෘජුකෝණාස්‍රයක පරිමිතිය ගණනය කිරීමට අදාල ආදාන සැකසීම් ප්‍රතිදාන වෙන වෙනම ලියන්න.
   (4) සෘජුකෝණාස්‍රයේ පරිමිතිය ගණනයට අදාල ඇල්ගොරිතමය ව්‍යාප් කේත ආශ්‍රයෙන් ලියන්න.

04 (1) මෙහෙයුම් පද්ධති සඳහා උදාහරණ හතරක් නම් කරන්න.
   (2) මෙහෙයුම් පද්ධතියක ප්‍රධාන කාර්යයන් නම් කරන්න.
   (3) මධ්‍යම සැකසුම් ඒකකයේ දළ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.
   (4) පහත දැක්වෙන දිගුවන්වලට අදාල ගොනු වර්ගය නම් කරන්න.
   - MP3 • Png • MP4

05 (1) අන්තර් ජාලයේ ප්‍රයෝජන තුනක් ලියන්න.
   (2) වෙබ් අතරික්සු දෙකක් හා සෙවුම් යන්ත්‍ර දෙකක් නම් කරන්න.
   (3) විද්‍යුත් ලිපින භාවිතයේ වාසි දෙකක් ලියන්න.
   (4) පහත දැක්වෙන එක් එක් දත්ත ගබඩා කිරීමේ ක්‍රම සඳහා උදාහරණ 1 බැගින් ලියන්න.
   - ප්‍රකාශ මාධ්‍ය • චුම්බක මාධ්‍ය • සනත්ත්වයේ මාධ්‍ය